ජාතික රෝහලේ මුදල් කොල්ලකෑමකට සම්බන්ධ යැයි සැක පිට අත්අඩංගුවට ගත් සැකකරුවෙකු සම්බන්ධයෙන් වන පෞද්ගලික තොරතුරු, මාධ්‍ය වාර්තාවන් ඔස්සේ හෙළිදරවු කෙරී තිබිණි. එහිදී එම සැකකරුගේ අධ්‍යාපන ගමන් මග, සීමාවාසික පුහුණුව, විවාහයට අදාළ කරුණු, සැකකරුගේ බිරිඳ පිළිබඳ තොරතුරු යනාදිය මෙන්ම සැකකරුගේ හා බිරිඳගේ මංගල ඡායරූපයක්ද ඔවුන්ගේ මුහුණු බොඳ කොට පළ කොට තිබිණි. එසේම තවත් පුවත් වාර්තාවක අදාළ සැකකරුගේ නම් වයස් ආදියද ඉදිරිපත් කෙරී තිබිණි.

මෙම සිදුවීම මහජන ලැදියාවට අදාළ විය හැකි වුවත්, මාධ්‍ය ආචාර ධර්ම සම්බන්ධයෙන් සිදුවන ජාත්‍යන්තර කතිකාවන් ඔස්සේ යෝජනා කෙරෙනා කරුණක් වන්නේ, යම් කිසි මහජන ලැදියාවට අදාළ වන කරුණකදී වුවද සැකකරුගේ අනන්‍යතාවය හෙළිදරවු කෙරෙන්නේ නම්, එය මහජන ලැදියාවට අදාළ වන්නේ කෙසේද යන්නද එම වාර්තාවන් ඔස්සේම සාධාරණීකරණය කළ යුතු බවයි.
මෙසේ බලන විට, සැකකරුවෙකුගේ පෞද්ගලික තොරතුරු මෙතරම් දුරට මාධ්‍ය ඔස්සේ හෙළිදරවු කළ යුතු යැයි ඔබ සිතන්නේද? සැකකරුවෙකුගේ අනන්‍යතාවය හෙළිදරවු කිරීම මෙහිදී යුක්තියුක්ත යැයි ඔබ සිතන්නේද?

මේ සම්බන්ධයෙන් වැඩිදුර පරිශීලනය සඳහා:
https://rm.coe.int/prems-guidelines-on-safeguarding-privacy-in-the-media-2018-/168090289b?fbclid=IwAR3IVhvtCQjdzY2cPHISEBOEyhyWRNvJ-i4Y1PdjBsdn6_Nw9U1MuJNziZ4

https://ethicaljournalismnetwork.org/the-public-interest

https://ijnet.org/en/story/applying-public-interest-test-journalism

#MediaEthicsSL #lka #SinhalaPress #News #SundayLankadeepa #SathiAgaAruna